සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Department of Education, Southern Province**

63 S I

**දෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි**
**Second Term Test, July 2018**

| | | |
|---|---|---|
| 10 ශ්‍රේණිය<br>Grade 10 | ව්‍යවසායකත්ව අධ්‍යයනය - I<br>Entrepreneurship Studies | පැය එකයි<br>One hour |

විභාග අංකය ..............................

**සැලකිය යුතුයි.**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරන්න.**

(01) ව්‍යවසායකත්වය තුළ දැකිය හැකි මූලික ලක්ෂණයක් වනුයේ,
1. ලාභ උපරිම කිරීමට පමණක් කටයුතු කිරීම
2. පවතින දේ පිළිබඳ විමසිලිමත් වෙමින් වෙනසක් කිරීමට උත්සාහ දැරීම.
3. අවදානම් මගහරිමින් ව්‍යාපාරික කටයුතුවල නියුක්ත වීම.
4. පවත්නා අදහස් සහ සංකල්ප එලෙසම ක්‍රියාත්මක වීමට සැලැස්වීම.

(02) ව්‍යවසායකත්වය යනු,
1. දක්මට පමණක් සම්බන්ධ වූවකි.
2. මිනිස් චින්තනය හා සම්බන්ධ වූවකි.
3. වාසනාව මත ලැබු තත්වයකි.
4. කාලීන අවශ්‍යතාවයක් ඉටු වීමකි.

(03) ව්‍යවසායකයෙක් හැම විටම විශ්වාස කරන්නේ,
1. අනෙකුත් ව්‍යවසායන් පිළිබඳවය
2. තමා පිළිබඳවය
3. තමාගේ පරම්පරාව පිළිබඳවය
4. තම වාසනාව හා දෛවය පිළිබඳවය.

(04) තම අදහස් මත තීරණවලට එළඹිය ද අන් අයගේ අදහස්වලට ගරු කරයි. එම අදහස් මත නොයැපෙයි. මෙහි තම අදහස් මත තීරණවලට එළඹීම් ව්‍යවසායකත්වයේ දී සැලකිය හැක්කේ,
1. ස්වාධීනත්වය ලෙසය
2. අභියෝග ලෙසය
3. වගකීම ලෙසය
4. සවන් දීම ලෙසය

(05) ව්‍යවසායකයකුට නිශ්චිත දක්මක් තිබීමෙන් අත්කර ගත හැකි ප්‍රයෝජනයකි.
1. සෙසු තරඟකරුවන් අඩපන කිරීම
2. තම නිපයුම් ලොවට හඳුන්වා දීම
3. ඉදිරි ගමන පැහැදිලි වීම
4. සේවකයින්ගේ ප්‍රමාණය වැඩි කිරීම

(06) ව්‍යාපාරික අදහස් ක්‍රියාත්මක කිරීමේ දී අවදානම් භාරගැනීම යනුවෙන් අදහස් කරනුයේ,
1. එම අදහස සාර්ථක වීම හෝ අසාර්ථක වීම
2. එම අදහස අසාර්ථක වීමට ඇති ඉඩකඩ වැඩි බව
3. එම අදහස ක්‍රියාවට නැංවීමට අපහසු වීම
4. එම අදහසේ ප්‍රතිඵල නිශ්චිත වන බව

(07) ව්‍යවසායකත්වය යන්නට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
1. ව්‍යාපාර අවදානම් භාර ගැනීමට ඇති හැකියාවයි.
2. නවත්‍යා සම්පාදනයකර නව ව්‍යාපාර ආරම්භ කිරීමේ හැකියාවයි.
3. සම්පත් ලබා ගැනීම හා කළමණාකරණය කිරීමේ හැකියාවයි.
4. නිෂ්පාදන සාධක ක්‍රියාවලියට යොමු කිරීමේ හැකියාවයි.

(08) ව්‍යවසායකත්වයේ ගති ලක්ෂණයකි ''නිර්මාණ ශීලීත්වය'' නිර්මාණ ශීලීත්වයට බාධාකාරී නොවන සාධකයක් වන්නේ,
1. විශ්වාසය හා ආකල්ප කෙරෙහි තද බල ලෙස ගැලී සිටීම
2. ගැටළුවක් සඳහා විවිධ විසඳුම් ඇති බව විශ්වාස කිරීම
3. වැරදි හා විවේචන කෙරේ ඇති බිය
4. ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම

(09) රටක දියුණුව රඳා පවතින්නේ දේශීය කර්මාන්ත මතය. දේශීය කර්මාන්ත ආරම්භ කිරීම සඳහා වඩාත්ම වැදගත් සම්පත වන්නේ,
1. පුහුණු ශ්‍රමිකයින්ය 2. යටිතල පහසුකම්ය
3. ව්‍යවසායකයින්ය 4. දේශීය අමුද්‍රව්‍යය

(10) ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයෙකුට හිමිවන ප්‍රතිලාභයක් වනුයේ,
1. රැකියා අවස්ථා සැපයිය හැකි වීම
2. නව භාණ්ඩ හා සේවා වෙළඳපලට ඉදිරිපත් කළ හැකි වීම
3. ආර්ථික සංවර්ධනයට දායක විය හැකි වීම
4. ඉහළ ප්‍රතිලාභයක් ලැබිය හැකි වීම

(11) පරිසරයේ වෙනස්වීම්වලට උචිත පරිදි අනුගත වීමට ඇති හැකියාව
1. නම්‍යශීලීත්වය නම් වේ. 2. අධිෂ්ඨානය වේ
3. ස්වාධීනත්වය වේ 4. කැප වීම වේ.

(12) අවදානම හා ප්‍රතිලාභ අතර සම්බන්ධතාව දක්වෙන නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. අවදානම ඉහළ නම් ප්‍රතිලාභය ඉහළ වේ.
2. අවධානමේ ස්වාධීනත්වය කුමක් වුවත් ප්‍රතිලාභ ඉහළ වේ.
3. අවදානම පහළ නම් ප්‍රතිලාභ ඉහළ වේ.
4. අවදානම ඉහළ නම් ප්‍රතිලාභ පහල වේ.

(13) පුද්ගලයකුට තම ජීවිතය පවත්වාගෙන යාමට අනිවාර්යයෙන්ම සපුරාගත යුතු මූලික දෑ
1. අවශ්‍යතා 2. වුවමනා 3. භාණ්ඩ 4. සේවා

(14) අවශ්‍යතා හා උවමනා සපුරාලන සේවාවක දැකිය හැකි ලක්ෂණය වන්නේ,
1. ස්පෘශ්‍ය වේ 2. සමජාතී බව ආරක්ෂා කළ හැකි වීම
2. ගබඩා කළ හැකි වීම 4. සපයන්නාගෙන් වෙන් කළ නොහැකි වීම

(15) පවතින සංකල්ප හෝ සාධක නව සංයෝගයක් හෝ මිශ්‍රණයක් භාවිතා කර නව නිපයුම් කිරීම
1. නව සොයා ගැනීමකි 2. දිගුවකි
3. සංකලනයකි 4. අනුකරණයක් කිරීමක් වේ

(16) සමාජයේ ප්‍රශ්නවලට නිර්මාණාත්මකව විසඳුම ඉදිරිපත් කරන පුද්ගලයා
1. අභ්‍යන්තර ව්‍යවසායකයා වේ 2. ව්‍යාපාර ව්‍යවසායකයා වේ
3. සමාජයීය ව්‍යවසායකයා වේ 4. නිර්මාණශීලී ව්‍යවසායකයා වේ

(17) ව්‍යවසායකත්වයෙන් ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභයක් නොවන්නේ,
1. දේශීය සම්පත් උපයෝජනය 2. රැකියා අවස්ථාවන් ජනිත වීම
3. ඉතා ඉහළ තෘප්තියකට පත් වීම 4. රටේ සමස්ථ නිෂ්පාදනය ඉහළ යාම

(18) කුඩා පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීමේ නිර්ණායක අතුරින් ප්‍රමාණාත්මක නිර්ණායකයක් නොවන්නේ,
1. ආයෝජිත ප්‍රාග්ධනය 2. සේවක සංඛ්‍යාව
3. භාවිතා කරන බලශක්ති ප්‍රමාණය 4. භාවිතා කරන තාක්ෂණය

(19) සේවකයන් පෙළඹ වීම හා අවශ්‍ය මග පෙන්වීම ව්‍යවසායකයාගේ
1. ව්‍යාපාරිකයා ලෙස වූ භූමිකාවයි 2. කළමනාකරුවා ලෙස වූ භූමිකාවයි
3. අයිතිකරු ලෙස වූ භූමිකාවයි 4. නායකයා ලෙස වූ භූමිකාවයි

(20) ව්‍යාපාරයකට පාලනය කිරීමට අපහසු සාධක ඇතුළත් කාණ්ඩය වන්නේ,
1. අයිතිකරුවන්, කළමනාකරුවන්, ගනුදෙණුකරුවන් 2. සේවකයන්, සැපයුම්කරුවන්, ගණුදෙනුකරුවන්
3. ණය හිමියන්, ණයගැතියන්, කළමනාකරුවන් 4. වැටුප්, පොලී අනුපාතය, ඉතිරි කිරීම

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

63 S II

දෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
Second Term Test, July 2018

10 ශ්‍රේණිය
Grade 10

ව්‍යවසායකත්ව අධ්‍යයනය - II
Entrepreneurship Studies - II

පැය දෙකයි
Two hours

විභාග අංකය ..........................

**සැලකිය යුතුයි.**

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

උසස් පෙළ අධ්‍යාපනය නිමාකර වසර දෙකක් පමණ කාලයක් ගෙවීගියත් දිලිනිට රැකියාවක් සොයා ගැනීමට නොහැකි විය. එනිසා ඇය දෙමාපියන්ට බරක් නොවී තමාට මෙන්ම සමාජයට යහපතක් කිරීමට ආදායම් උපයා ගත හැකි ස්වයං රැකියාවක් ගැන සිතන්නට විය.

තම නිවසට යාබදව සිය මව විසින් දීර්ඝ කාලයක් තිස්සේ සුළු පරිමාණ ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් සම්ප්‍රදායික ක්‍රමයට පවත්වා ගෙන යයි. උසස් පෙළ විභාගයට පෙනී සිටීමෙන් පසු හය මාසික ඇඳුම් මැසීමේ පාඨමාලාවක් හදාරා තිබූ දිලිනිට සිය මව පවත්වා ගෙන යන ව්‍යාපාරයේ ඇති අඩුපාඩු කම් මැනවින් වැටහිණි. මේ පිළිබඳව සිය මව සමග සාකච්ඡා කළ දිලිනිට මව විසින් පවත්වා ගෙන ආ ව්‍යාපාරය නවීකරණය කර පවත්වා ගෙන යාමට අවස්ථාව ලබාදුනි.

ඒ අනුව තම පියාගෙන් රු 100 000 ක් ද, ලංකා බැංකුවෙන් රු 200 000 ක ණය මුදලක් ද ලබාගෙන ඇඳුම් මැසීමේ ව්‍යාපාරය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය මහණ මැෂින් සහ වෙනත් උපකරණ මිල දී ගන්නා ලදී. දිලිනි, ඇය සමග ඇඳුම් මැසීමේ පාඨමාලාව හදාරණ ලද යෙහෙළියන් තිදෙනෙක් සේවයට බඳවා ගෙන මනා කළමනාකරණයකින් යුක්තව ව්‍යාපාර කටයුතු මෙහෙය වන ලදී. එනිසා ප්‍රදේශයේ බොහෝ දෙනා ඇයගේ ව්‍යාපාරයට ඇඳුම් පැළඳුම් මසා ගැනීමට පැමිණියහ. එසේම ඇය හැකි සෑම අවස්ථාවක දීම දේශීය අමුද්‍රව්‍ය මිල දී ගන්නා ලදී.

ව්‍යාපාර කටයුතු දියුණු වීම තුළින් දිලිනි ආකර්ශනීය ලාභයක් ද ලැබුවා ය. ලද ලාභයෙන් කොටසක් ප්‍රදේශයේ පාසල් සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීමට සහ වෙනත් සමාජ සුභසාධන කටයුතු සඳහා පරිත්‍යාග කරන ලදී. ඉතා කෙටි කාලයකින් දිලිනිගේ දක්ෂ්ම සාක්ෂාත් කරමින් ඇයගේ ඇඳුම් මැසීමේ ව්‍යාපාරය ප්‍රදේශයේ ජනප්‍රියම ඇඳුම් මැසීමේ ව්‍යාපාරය බවට පත් විය.

i. මෙම සිද්ධියට අනුව දිලිනිගේ ව්‍යාපාරය ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණ කුමක් ද?
ii. දිලිනි තුළ දකිය හැකි ව්‍යවසායකත්ව ලක්ෂණ 2ක් ලියන්න.
iii. මෙම ව්‍යාපාරය නවීකරණය කිරීම සඳහා ප්‍රාග්ධනය සපයාගත් ආකාර 2ක ලියන්න.
iv. දිලිනි ව්‍යවසායකයෙක් ද ව්‍යාපාරිකයෙක් ද යන්න සඳහන් කරන්න.
v. දිලිනිගේ ඇඳුම් මැසීමේ ව්‍යාපාරය දියුණු වීමට බලපාන ලද හේතු 2ක් ලියන්න.
vi. මෙම ව්‍යාපාරය මඟින් ඉටුකරනු ලබන මූලික අවශ්‍යතාව කුමක් ද?
vii. සිද්ධිය ආශ්‍රයෙන් මෙම ව්‍යාපාරයෙන් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ 2ක් ලියන්න.
viii. දිලිනිට ව්‍යාපාරයෙන් හිමිවන ප්‍රතිලාභ 2ක් ලියන්න.
ix. ව්‍යාපාරවල ප්‍රමාණය අනුව වර්ග කිරීමේ දී මෙම ව්‍යාපාරය කුමන පරිමාණ වර්ගයට අයත්වේ ද? එයට හේතු 2ක් ලියන්න.
x. සිද්ධියට අනුව දිලිනිගේ දක්ෂ්ම වූයේ කුමක් ද?

(ලකුණු 2 × 10 = 20)

(02) i. ව්‍යවසායකත්වය යනු කුමක්දැයි නිර්වචනය කරන්න.
ii. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන නිෂ්පාදන සාධක නම් කරන්න.
iii. නිෂ්පාදන සාධක අතුරින් වඩාත් සුවිශේෂ නිෂ්පාදන සාධකය නම් කර එයට හේතුව දක්වන්න.
iv. ව්‍යවසායකත්ව ගති ලක්ෂණ 4ක් ලියන්න.
v. 'නිර්මාණශීලිත්වය' යනු කුමක් දැයි නිර්වචනය කරන්න.

(ලකුණු 2 × 5 = 10)

(03) i. නවෝත්පාදන සිදුවන ආකාර 2ක් ලියන්න.

ii. නිර්මාණශීලීත්වයට බාධාකාරීවන සාධක 2ක් ලියන්න.

iii. නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍ර 2ක් ලියන්න.

iv. නිර්මාණශීලීත්වය හා නවෝත්පාදනය අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

v. අවදානම හා ප්‍රතිලාභය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරන්න.

(ලකුණු $2 \times 5 = 10$)

(04) i. අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් 2ක් ලියන්න.

ii. භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් 2ක් ලියන්න.

iii. ව්‍යාපාරවල ගති ලක්ෂණ 2ක් ලියන්න.

iv. ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර සමානකම් 2ක් සඳහන් කරන්න.

v. ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර වෙනස්කම් 2ක් ලියන්න.

(ලකුණු $2 \times 5 = 10$)

(05) i. 'ව්‍යවසායකත්වය රටක සංවර්ධනයට බෙහෙවින් ඉවහල් වේ' රටක සංවර්ධනයට ව්‍යවසායකත්වයෙන් ලැබෙන ප්‍රතිලාභ 2ක් ලියන්න.

ii. ව්‍යවසායකත්වයෙන් ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභ 2ක් ලියන්න.

iii. ව්‍යවසායක වර්ග 2ක් ලියන්න.

iv. ව්‍යවසායකත්වයෙන් ඇතිවන සමාජ ප්‍රතිලාභ 2ක් ලියන්න.

v. පරිමාණය අනුව ව්‍යාපාර වර්ග කර දක්වන්න.

(ලකුණු $2 \times 5 = 10$)

(06) i. කුඩා පරිමාණ ව්‍යාපාරවල ගති ලක්ෂණ 2ක් ලියන්න.

ii. 'රටක සංවර්ධනයට කුඩා පරිමාණ ව්‍යාපාරවල දායකත්වය ඉතා වැදගත් වේ'' මෙය සනාථ කිරීමට හේතු 2ක් ලියන්න.

iii. කුඩා පරිමාණ ව්‍යාපාරවල දැකිය හැකි ශක්තීන් 4ක් ලියන්න.

iv. කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු 4ක් සඳහන් කරන්න.

v. ව්‍යවසායකයකුගේ භූමිකා වර්ග 2ක් ලියන්න.

(ලකුණු $2 \times 5 = 10$)